(පිටු අංක: 18)    (ඇමුණුම්:4)

======

මධ්‍යම පළාතේ 1990 අංක: 02 දරණ හදිසි

අවස්ථා අරමුදල ප්‍ර ඥා ප්ති ය

---

( 1990.03.07 දින අනුමත කරන ලදී )

1987 අංක: 42 දරණ, පළාත් සභා පනතේ 20(1) වගන්තිය යටතේ හදිසි අවස්ථා අරමුදලක් පිහිටුවීම පිණිසද, රට සම්බන්ධ සහ අනුශංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජා තන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

කෙටි නාමය

1. මේ ප්‍රඥප්තිය 1990 අංක: 02 හි හදිසි අවස්ථා අරමුදල ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, එය ආණ්ඩුකාරවරයා විසින් අනුමත කළ දිනයේ සිට ක්‍රියාත්මක වන්නේය.

පළාතේ හදිසි අවස්ථා අරමුදල:

2. මධ්‍යම පළාතේ අනපේක්ෂිත වියදම් දැරීමේ අරමුණින් ( මෙහි මින් මතු අරමුදල යනුවෙන් සඳහන් කරනු ලබන ) හදිසි අවස්ථා අරමුදලක් මෙයින් ඇති කරනු ලැබේ.

II. රුපියල් දශ ලක්ෂ එක(1) ක මුදලක් පළාත් අරමුදලෙන් මෙම අරමුදලට බැර කළයුතු අතර, එම මුදල අරමුදලේ කොටසක් විය යුතුය.

III. පළාත් සභාව විසින් සම්පාදිත ප්‍රඥප්ති මගින් කලින් කලට තීරණය කෙරෙන සියළු මුදල් මෙම අරමුදලට බැරකළ යුතුය.

අරමුදලෙන් අත්තිකාරම් ගෙවීම 20(2) වගන්තිය අනුව කළ යුතුය.

3. අරමුදලෙන් අත්තිකාරම් ගෙවීමේදී 1987 අංක: 42 දරණ පළාත් සභා පණතේ 20 (2) උප වගන්තියේ දැක්වෙන විධි විධාන, අනුගමනය කළ යුතුය.

අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතුය.

4. අරමුදලේ භාරකාරත්වය ආණ්ඩුකාරවරයා යටතේ විය යුතු අතර, ඉන් කෙරෙන සියළු අත්තිකාරම් ගෙවීම් ඔහු අතින් සිදු විය යුතුය.

---

සි/-